# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION


සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1540 /2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 08/12/2023<br>පැය 1115 |

## මාධ්‍ය නිවේදනය

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුර.**

2023.12.07 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තෙල්දෙණිය පොලිස් වසමේ කෙන්ගල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 310 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන තෙල්දෙණිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන දියබුබුල, කෙන්ගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** තෙල්දෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2023.12.07 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කටුවන පොලිස් වසමේ කටුවන ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 01 මිලිග්‍රෑම් 40 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කටුවන පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන හිදකරල්දෙණිය, කටුවන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කටුවන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුර.**

2023.12.07 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත දමන පොලිස් වසමේ පන්නල්ගම ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන දමන පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 53 හා 60 අතර වයස් වල පසුවන කත්දේඋඩපංගුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** දමන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**